# කෙටිකතාව

විමලක්කා විසුවේ අපේ නිවසට ඉහලින් පිහිටි කඳු ගැටයක තනා ගත් නිවසකය. සැලැසුම් කළ පවුලක් වූ එහි විසුවේ ඇයත් ඇයගේ මහලු මවත් නෙත් අඳ පියාත් පමණි. ඇයට ගම්මුන්ගේ අනුකම්පාවත් ආදරයත් හරි හරි හැටියට ලැබී තිබුනි. අනුකම්පාව ලැබී තිබුනේ ඇය මීමැස්මොර කාරියක වීම හේතුවෙනි. නිසිවයස පසුවීත් විවාහ නොවීම නිසා ඇතැම්හු ඇයට නාකි ලම්ස්සී යැයි කීහ. තරමක හැඩකාර පෙනුමක් තිබූ ඇයට මේ අන්දමට කලට වෙලාවට මල්හීසර නොවැදුනේ මන්දැයි යන්න ගැමි ලියන් අතර නිතර රැව්දුන් ප්‍රශ්නයක් විය.

ඇගේ ලස්සන අවලස්සන කෙසේ වෙතත් අප කුඩා සන්දියේදී ඒ නිවස අසලින් යාමට වත් සැරසුනේ පරාණ බියකිනි. ඊට හේතුව වූයේ මීමැස් මොරය හැදුනු විට අත්පා දරදඬුවී දත කට පූට්ටුවී යන ස්වරූපය දෙතුන් විටක් දැකීමෙනි.

"ඕව මායං .....ඕකිට වෙන දෙයක් නෙවෙයි වැහිල තියෙන්නෙ කලු කුමාර දිෂ්ඨිය ...., අම්මා තවත් ගැහැනුන් හා කීවේ වරක් දෙවරක් නොවේ. විමලක්කා ට තිබුනු මද සිහිමඳකම ඇගේ මේ අනුමානයට හේතු වූවා යැයි මට පසුව සිතිනි.

මේ කරුණු කෙසේ වුවත් විමලක්කාට මල් මාලා ගෙතීමේ හා මෝස්තර කලාවේ නිපුනත්වයක් උපතින්ම දායාදා වී තිබුනි. අපේ

<u>අපේ ගම හරහා නගරයට වැටී තිබෙන මහ මාරගය දිගේ තවදත් කලින් කලට වීරයෝ ද ජය පැන් පතන්නෝ ද ඔබ මොබ ගියහ. දේශපාලනඥයෝ, ක්‍රීඩකයෝ, කලා කරුවෝ, ව්‍යාපාරිකයෝ අපේ ගමෙන් හා අවට ගම්මාන වලින් හතු පිපෙන්නා මෙන් පහල වූහ.</u>

ගමට නුදුරින් පිහිටි අත්හැර දැමූ වැව අද්දරින් පන් උගුල්ලා ගෙන පදම් කොට ඇය වියන මෝස්තර අපූරු ඒවා විය. ඊටත් වඩා කාගේත් සිත් ගත්තේ ඇය ගොතන මල් මාලාය. ඒවා අපේ ගම අසල පිහිටි ගගේ දේවාලයට යන බැතිමතුන්ට පහසුවෙන් අලෙවි කර ගත හැකි විය.

ඇගේ නිවසේ හා අසල් වාසීන්ගේ නිවෙස් කිහිපයකින් කඩා ගන්නා සමන් පිච්ච මල් වලින් මේ මල් මාලා බොහෝ අවස්ථා වල සැකසී තිබුනි. එහෙත් විශේෂ අවස්ථාවල ක්‍රේප් කඩදාසි වලින් අපූරු ගෙත්තම් කරමින් ඇය ගොතන මල් මාලා ගැනුම් කරුවෝ දෙවතාවක් නොසිතාම මිලට ගත්හ. දේශපාලනඥයින් හා විශේෂ අමුත්තන් පිලි ගන්නා අවස්ථාවලදී ඒ සඳහා හදිසි ඉල්ලීම් ගලා අවේය. හැම පක්ෂයේම පාට තිබෙන ක්‍රේප් කඩදාසි ගොන්නක් ඇය නිවසේ මේවා සඳහා නිතරම සූදානමින් සිටියේය. ඇගේත් ඈ සමග විසූ මහලු දෙමාපිය යුවලගේත් කුස් පිරුනේ මේ ව්‍යායාමයෙන් ලද ආදායමෙනි.

මිනිස්සු කිසියම් අදෘශ්‍යමාන බලවේගයකට හෝ තමන් ගරු කරන පුද්ගලයකුට තම ප්‍රනාමය දැක්වීම සඳහා පුදන ගොතන මේ මල් මාලාවකින් ඇය කවරාකාරයේ තෘප්තියක් ලබන්නේද යන්න මට බොහෝ විට ගැටලු සහගත ප්‍රශ්නයක් විය. එසේ වූයේ ඇය අදහන දේශපාලන දහම කුමක් වුවද ජීවන සටන කරගෙන යාම සඳහා මල් දම් ගෙතීමේදී එය කිසිඳු අන්දමකින් බාධාවක් කර නොගැනීමය.

විමලක්කා අපූරු මල් දමක් ගොතන බවත් එය නොමිලයේ පිරිනමනන්ට යන එකක් බවත් සැලවූයේ පහල ගෙදර පුංචි අම්මා ගෙනි. ඇයගේ කතාව ඇත්තක් බව පසුව කළ විමසීමකදී අපට පෙනනි. ඇත්තටම ඒ මල්මාලාව අපූරු එකක් විය. සමන් පිච්චල ඉද්ද හා අරලිය මල් වලින් මූලික වශයෙන් ගෙතුනු එය අහල පහල වතුවලින් නෙලා ගන්නා ලද විවිධ පාටැති මල් වලින් මනා වරණ සංයෝජනයක් එක් කර තිබුනි.



# මල් දම

ඇගෙන් මල් මාලා මිලට ගැනීමට ආ ගැනුම් කරුවෝ මේ අඩක් නිමවී ඇති මල් දම කෙරෙ විටින් ලොබ බැන්දහ. ඇය ඔවුන්ට කීවේ මේ මල් මාලාව පිරිනමන්නට හිතෙන පුද්ගලයා තවමත් ඇය හමු නොවී ඇති බවයි. මේ කතාව මුලදී බොහෝ දෙනෙකුගේ හාස්‍යයට හේතු විය. ,ඔය නිකං කියෙ-ා්නව. එයාගෙන් මල් මාලා දා ගන්න කුමාරවරු පෝලිමේ එයි. තුට්ටු දෙකක් හොයා ගන්න රස්සාව කර ගෙන ඉන්නෙ නැතිව විකාර දොඩවනව......,

එහෙත් ඉඩකඩ තිබෙන හැමවෙලාවකම විමලක්කා මේ මල් දම ගෙතුවාය. පරවෙන මල් වෙනුවට ඉතා සීරුවෙන් මල් එකතු කර ගෙන ගෙකෙන මේ මල් දමෙන් පිදුම් ලබන්නේ කවුරුන් විය හැකිද? ඇත්තටම අගේ වීරයා කවුද යන්න මට වඩාත් කුතුහලය දනවන ප්‍රශ්නයක් විය. අපේ ගම හරහා නගරයට වැටී තිබෙන මහ මාරගය දිගේ තවදත් කලින් කලට විරයෝ ද ජය පැන් පතන්නෝ ද ඔබ මොබ ගියහ. දේශපාලනඥයෝ, ක්‍රීඩකයෝ, කලා කරුවෝ, ව්‍යාපාරිකයෝ අපේ ගමෙන් හා අවට ගම්මාන වලින් හතු පිපෙන්නා මෙන් පහල වූහ. එහෙත් මේ එකෙකුවත් මේ විමලක්කාගේ අර අපූරු මල් දමින් පිදුම් ලබන්නට වාසනාවන්තයෝ නොවූහ.

ඇත්තටම කාලය ගතවන වට ඇගේ තීරණය නිවැරැදි බව කාටත් පැහැදිලිව පෙනිනි. මුලු ගම් පලාතටම ජීවකයකු ලෙස පෙනී සිටියත් ඇගේ අර මල් කලඹෙන් පිදුම් ලබන්නට නොහැකි වූ වෙද දුරෙක් ගබ්සා මඩමක් පවත්වාගෙන යද්දී අතට ම අසුවිය. තරුණ කැල මත් උවදුරින් ගලවා ගැනීමට වලිකෑ අමද්‍යප ව්‍යාපාරයේ අපේ ගමේ සභාපති තුමා මේ මල් කලඹෙන් පුද ලබන්නට ඔන්න මෙන්න කියා තිබුනි. අදෝමැයිෟ ඔහු හොර අරක්කු ගුබ්බෑයමක ලැග සිටියදී තවත් පිරිසක් සමග අත් අඩංගුවට පත්වුන විට වෙරිය සිඳුනේ රිමාන්ඩ් භාරයේ පසුවද්දීය.

එහෙත් විමලක්කා ට මේ නිසා

ඩබ් එච් උපසේන
විලස් හිල්, වික්ටෝරියා

බොහෝ දුක් ගැහැට හා නව නින්දා වලට මුහුන දීමට සිදුවිය. අපේ ගම් පලාතෙන් මනාප විශාල සංඛ්‍යාවක් ඩැහැගත් පලාත් සභා මන්ත්‍රීවරයාගේ ගෝලයෝ ඇයගේ නිවස ගිනි ලෑමට තැත් කළහ. පැතුම් සුන්වූ බොහෝ දෙනෙක් ඇයට බොහෝ කථා හැදූහ. එහෙත් විමලක්කා නෙවේ මෙයින් සැලුනේ. ඇය දිරිය ගනිමින් හැකි සෑම විටම අර මල් මාලාව ගෙතුවාය. පරවන මල් වෙනුවට අලුත් මල් සොයමින් මල් දම වඩාත් කදිම ට ගෙතුවාය. ඇගේ මේ ක්‍රියාවලිය දෙස ඉඳහිට බලන විට මට සිතුනේ මෙය දෙවැනි වන්නේ ඇගේ හුස්ම ගැනීමේ ක්‍රියාවලියට පමණක් බවය. ඒ ගැනි ගෙ මොලේ හොඳ නැතිව කරන වැඩක් බං.......ගමේ කොල්ලෝ කීවේ වරක් දෙවරක් නොවේ. මෙයාට මල් මාල දම්මන්නෙ එකෙක් පිට රටින් තමයි ගේන්න ඕනි........

මේ කාලය ඇතුලත අපේ ගමේ බොහෝ වෙනස් කම් ඇති විය. එය අපේ ගමට යාබද නගරය ඇඳා ගනිමින් පැවැතිනි. නගරයේ තිබුනු ඇඟැලුම් පැක්ටේරියේ ශාඛාවක් ගමේ පිහිටුවීමත් සමග අපේ ගමේ අතුරු පරාවල් පවා පලල් වී ගියේය. ගෙවල් දොරවල් වැඩිවී ගම ඇහිරෙමින් නගරයේ ම කොටසක් වෙමින් තිබුනේය.

අලුත් මිනිසුන්, බෝඩින් කාරයින්, මත්පැන් හලවල් හා සුපමාරකැට්ටු ඉදිවුනු අතර විමලක්කාගේ මල් මාලා ගෙතිම පමණක් නොවෙනස්වී තිබුනි. ඉතින් මේ අලුත් ජනකොටස් අතරින් හෝ ඇයට නියම වීරයෙක් සොයා ගත හැකි වේයැයි මම සිතා සිටියෙමි.

රැකියාව රැත ගැනීම සඳහා මම ගමෙන් බොහෝ කාලයක් පිටවී ගොස් සිටියෙමි. එකම ජීවන රටාවකට හුරුවීම නිසා මේ කාලය වන විට මගේ මොලය හොඳටම කුරුවල් වී තිබුනේය. අපේ නිවස තිබෙන ගෙවල් මණ්ඩියට යන අඩිපාර පවා සොයා ගත හැකිවූයේ තරමක අපහසුවකිනි.

වයසට යාම සමග තරමක් කෘෂව සිටියද ඇගේ කඩිසර භාවය කිසි ලෙසකිනිදු වෙනස් වී නොතිබුනි. ඇගේ අර මල් මාලාවට පරවන මල් වෙනුවට අලුත් මල් එක්වෙමින් හැඩ වෙමින් තිබුනේය. මේ මල් මාලාව මොහොතකට හෝ හිමිකාරයකු වීමට ඕනෑම පෘතග්ජන පුද්ගලයකුගේ ' සිතෙනු ඇතැයි මට නොයෙක් වර සිතුනි. එය පරිස්සමින් බලන්නකුට මිස පිට කෙනෙකුට පෙනෙනු ඇත්තේ මල් ගොමුවක් පරිද්දෙනි. එතරම් සූක්ෂම විදියට ඇය තම දෑත හසුරුවමින් සොබා දහමේ සුන්දරත්වය වඩාත් ඔප දමමින් මේ මල් කළඹ නිමවමින් සිටියාය.